# කළමනාකරණ කමිටු රැස්වීම

**දිනය - 2023.02.20**

**වෙලාව - ප.ව. 2.15**

**ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ,ප)**

**මූලාසනය - ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය**

1. ඩබ්ලිව් .එම්. දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
4. කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
5. කේ.ආර්.අබේසිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
6. කේ.ජී.එස්.ප්‍රසන්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
7. කේ.එන්.කේ.සිල්වා මිය - ආදායම් කොමසාරිස් (බ.ප)
8. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)
9. පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය
10. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා - අධ්‍යක්ෂ (අය වැය)
11. ඩබ්ලිව්.ඒ.සී.එස්.ප්‍රියදර්ශනී මිය - අධ්‍යක්ෂ ( ආදායම්)
12. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)
13. ආර්.පී ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි)
14. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
15. ආශා පනාගොඩ මිය - අධ්‍යක්ෂ(ඉංජිනේරු)
16. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු
17. කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සහා ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධව | අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති ලබා ගැනීම සඳහා සකස් කරන ලද ආකෘති පත්‍රයේ ගැටළුවක් පැවතීම හේතුවෙන් නැවත එය සකස් කර යැවීමට කටයුතු කල බවත් , සෞඛ්‍ය අංශ සංවර්ධන වැය හා පළාත් සංවර්ධන ප්‍රදාන මඟින් ලැබෙන ප්‍රතිපාදන මේ වන විට ලැබී ඇති බවත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන සම්බන්ධව අවිනිශ්චිත භාවයක් පවතින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>එම ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති සිදු කිරීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළාත් සංවර්ධන ප්‍රදාන හා සෞඛ්‍ය අංශ සංවර්ධන වැය මඟින් ලැබෙන ප්‍රතිපාදන වලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා මසකට වරක් රැස්වීමක් පැවැත්විය යුතු බවට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය/ සැලසුම්) |
| 02. | පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීම සම්බන්ධව | මූල්‍ය අංශය ,නීති ඒකකය හා අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීමට තොරතුරු තාක්ෂණ නිලධාරීන් වෙත බාර දී ඇති අතර නීති ඒකකයේ එම කාර්යය මෙතෙක් සිදු නොවීම සම්බන්ධව ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව එම කටයුතු පවරන ලද නිලධාරීන් කැඳවා විමසීම් කළ අතර මූල්‍ය අංශයේ හා විගණන අංශයේ දත්ත පද්ධති සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් නීති ඒකකයේ දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට පවරන ලද නිලධාරියා හට පවතින කාර්ය බහුලත්වය මත එය සිදු කිරීමට හැකියාවක් නොවූ බව ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු සුදුසු වෙනත් තොරතුරු තාක්ෂණ නිලධාරියෙකුට පැවරීමට සාකච්ඡා කල අතර කඩිනමින් එය ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 03. | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අංශවල පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් යෙදවීම සම්බන්ධව | සෞඛ්‍ය අමාත්‍යාංශය , අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම අනෙකුත් අමාත්‍යාංශවල පුරප්පාඩු සඳහා බහුකාර්ය සේවා නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>තවද තම අංශයේ මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක් සංවර්ධන සහකාරවරුන් සේවයේ නියුතුව සිටින අතර ඔවුන් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අන්තර්ග්‍රහණය නොවීම මත ඔවුන්ගේ ස්ථාන මාරු සම්බන්ධ ගැටළුවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව සංවර්ධන නිලධාරී, සංවර්ධන සහකාර තනතුරු දෙකෙන්ම කාර්ය භාරයන් සමාන වන බැවින් හා වැටුප් පරිමාණයන්ද සමාන වන බැවින් සංවර්ධන නිලධාරීන් සමඟ ස්ථාන මාරු සිදුකිරීම සම්බන්ධව ගැටළුවක් නොපවතින බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 04. | ඉංජිනේරු අංශයේ විදුලි කාර්මික ශිල්පියෙකු පත් කිරීමේ ගැටළුව සම්බන්ධව | ඉංජිනේරු අංශයෙහි දැනට සේවයේ නියුතු කාර්යාල කාර්ය සහයක නිලධාරියෙකු විසින් මෙතෙක් සියළුම විදුලි කාර්මික කටයුතු සිදු කරනු ලබන අතරම පවතින විදුලි කාර්මික ශිල්පී පුරප්පාඩු පිරවීම සඳහා බහුකාර්ය සේවකයන් යොමුකර ඇති බවත් ඒ සඳහා මෙතෙක් විදුලි කාර්මික කටයුතු සිදු කළ කාර්යාල කාර්ය සහයක නිලධාරියා එම තනතුරට පත් කිරීමට සුදුසුකම් පවතින බැවින් ඒ සඳහා ඉල්ලීමක් කරන ලද බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එම කාර්යාල කාර්ය සහයක නිලධාරියාට විදුලි කාර්මික ශිල්පය පිළිබඳ අධ්‍යාපන සුදුසුකම් මෙන්ම ප්‍රායෝගික දැනුමද පවතින බව වැඩිදුරටත් සාකච්ඡා කළ අතර ඒ පිළිබඳ ඉදිරි කටයුතු කිරීම සඳහා අදාළ තොරතුරු යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු / ඉංජිනේරු) |
| 05. | සැලසුම් අංශයට සංඛ්‍යා ලේඛණ නිලධාරියෙකු පත් කිරිම සම්බන්ධව | සැලසුම් අංශයේ සේවයේ නියුතුව සිටි සංඛ්‍යා ලේඛනඥ සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේනතුව වෙත ස්ථාන මාරු වී ඇති අතර එම පුරප්පාඩුව සඳහා සංඛ්‍යා ලේඛණඥයෙකු පත්කර ගැනීමේ අවශ්‍යතාව පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේනතුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ඒ බව දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් අන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු / සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 06. | අපද්‍රව්‍ය කලමනාකරණ අධිකාරියේ කාර්යාලය බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලෙන් ඉවත් කිරීම සම්බන්ධව | අපද්‍රව්‍ය අධිකාරියේ කාර්යාලය 2023.03.31 දින වන විට බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත් කර ගන්නා ලෙසට ලිඛිතව දන්වා ඇති අතර ඔවුන් විසින් ඉදිරිපත් කරන කිසිදු අභියාචනයක් භාර නොගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>ඒ අනුව 2023.03.31 දින වන විට එම කාර්යාලය වහාම ඉවත් කර ගත යුතු බවත් ඉවත් කර ගන්නා කාල වකවානුව හා ආකාරය පිළිබඳ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ සමඟ සාකච්ඡාවක් සූදානම් කරන ලෙස වැඩි දුරටත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | රාජ්‍ය ආයතනවල නීති කටයුතු සඳහා බාහිර නීතිඥවරුන් යොදා ගැනීම සම්බන්ධව | කැබිනට් මණ්ඩලය මඟින් රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු , හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා බාහිර නීතිඥවරුන්ගේ සහය ලබා ගැනීම සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් නිකුත් කර ඇති අතර එය පළාත් සභාවට අයත් ආයතන සඳහා අදාළ කර ගැනීමේදී ප්‍රායෝගික ගැටළු මතුවන බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිත පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රධාන නීති නිලධාරී |
| 08. | 2023 වර්ෂයේ එක් එක් තනතුරු වලින් විශ්‍රාම ගන්නා නිලධාරීන් සම්බන්ධව ලේඛණයක් සකස් කිරීම | ඉදිරියේදී කිසිදු තනතුරක් සඳහා නව බඳවා ගැනීම් සිදුකල නොහැකි බැවින් ඒ සම්බන්ධව ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳව පෙර සිටම සූදානම්ව සිටිය යුතු අතර මෙම වසරේ අංශ මට්ටමින් විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් තනතුරු අනුව ලේඛනගත කර මීළඟ කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 09. | වාහන අළුත් වැඩියා කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීම සම්බන්ධව | වාහන අළුත් වැඩියා කිරීමේ කටයුතු වලදී යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බැවින් ඒ සඳහා ඩිපෝ ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබා ගැනීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් විසින් විමසීමක් සිදුකර ඇති අතර එසේ වාර්තාවක් ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු විමසන ලදී.<br><br>ඒ අනුව ඩිපෝ ඉංජිනේරු යන තනතුර යාන්ත්‍රික ඉංජිනේරු තනතුරක් නොවන බැවින් ඒ සඳහා පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව , කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන ආයතනවල සිටින යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාව ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් එසේ කිරීමට නොහැකි අවස්ථාවකදී පමණක් විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස මෝටර් රථ පරීක්ෂකවරයෙකු හෝ ඩිපෝ ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනීමට අනුමැතිය ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් වීසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත